# ශ්‍රී ලාංකේය කෘෂි කාර්මික කෙම් ක්‍රමයන්හි බෞද්ධාගමික ලක්ෂණ

- ආචාර්ය කනංගමුවේ රාහුල හිමි

බුදුසමය හා කෘෂි කර්මාන්තය අතර ඇත්තේ අත්‍යන්ත සම්බන්ධතාවකි. බුදුසමය කිසි විටෙකත් සමාජ අහිතකර ජීවනෝපාය මාර්ගයන් අනුමත කළේ නැත. අවිහිංසාවාදීව දිවි පෙවෙත ගත කළ පුරාණිකයෝ ගොවිතැන දේවත්වයෙන් පිදූහ. අප බුදුන් වහන්සේගේ ශ්‍රී නාමය පවා කෘෂි කර්මාන්තයට සම්බන්ධ වේ. එසේම භික්ෂූන් වහන්සේලාගේ චීවරය සකසා ගැනීමට මගධ කෙතේ ආකෘතිය තීරණය වූයේද බුදු සමය හා කෘෂි කර්මාන්තය අතර ඇති සම්බන්ධය නිසාවෙනි. ශාක්‍ය කෝලිය ගැටුම ඇතිවීමට හේතු වූයේද කෘෂි ජීවිතය හා සම්බන්ධ සිද්ධියකි. සුද්දෝදන, අමිතෝදන ආදී රාජ නාමාවලීන්ගෙන් ද පැහැදිලි වන්නේ කෘෂි ජීවිතයේ උදාරත්වයයි. රාජකීයයන් පවා වප් මඟුල් උත්සව පැවැත්වූ ආකාරය බෞද්ධ සාහිත්‍යයෙන් පෙනේ.

කෘෂි කර්මාන්තයේදී ගොවියන්ට විවිධ උවදුරුවලට මුහුණපාන්නට සිදුවිය. කෘමීන් ආදී විවිධ සතුන්ගෙන් කෘෂි භෝග ආරක්ෂා කර ගැනීමට ගොවියන්ට විශේෂ පරිශ්‍රමයක් දැරීමට සිදුවිය. අවිහිංසාවාදය පෙරදැරිකරගත් ගොවියෝ තම ගොවිපල ආරක්ෂා කර ගැනීමට ධාර්මික උපක්‍රම යොදාගත්හ. එම ක්‍රමවේදය සිංහල ව්‍යවහාරයෙහි "කෙම් ක්‍රම" යනුවෙන් හැඳින්වේ. මෙම නිබන්ධනයෙහි අරමුණ වන්නේ ශ්‍රී ලාංකේය කෘෂි කාර්මික කෙම් ක්‍රමයන්හි බෞද්ධාගමික ලක්ෂණ පිළිබඳ



විමසා බැලීමයි. එබැවින් බුදු සමය හා කෘෂි කර්මාන්තය අතර සම්බන්ධ පිළිබඳ දීර්ඝ විස්තරයක් මේ තුළින් විවරණ නොකෙරේ. ශ්‍රී ලංකාව ආර්ය ජනාවාසයක් වීම පිළිබඳ කෙටි හැඳින්වීමක් අන්තර් ගත වන්නේ ප්‍රස්තුත මාතෘකාවට ප්‍රවේශයක් වශයෙනි.

ශ්‍රී ලංකාව ආර්ය ජනාවාසයක් බවට පත් වූයේ ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ සභ්‍යත්වය තුළ පළ පුරුදුකම් තිබූ සංක්‍රමිකයන්ගෙන් බව වංශ කතාවන්ගෙන් පැහැදිලි ය. ඉන්දු ඉරාණීය ආර්ය ජනතාව ඉන්දියාවේ බටහිර දිග හා වයඹ දිග ප්‍රදේශයෙනුත්, නැගෙනහිර හා ඊශාණදිග ප්‍රදේශයෙනුත් ලංකාවට සංක්‍රමනය විය. ඔවුහු කෘෂි කර්මාන්තය, සත්ව පාලනය, වෙළඳාම ප්‍රධාන ජීවනෝපාය මාර්ග කරගෙන විසූහ. ලංකාවට පැමිණි මේ ආදිතම සංක්‍රමනිකයෝ තම හුරු පුරුදු ජීවනෝපාය ක්‍රමයන්ට ගැලපෙන පරිදි තම ජීවන තත්වයන් සකසා ගැනීමට උත්සහ ගත්හ. ඒ සඳහා සුදුසු භූමි ප්‍රදේශයන් තෝරාගෙන ජනාවාස පිහිටුවා ගත්හ. තම ජීවන තත්වයට අවශ්‍ය පරිදි ගංගාධාරයන් උපයෝගී කරගෙන ඔවුන් මුලදී ජනාවාස ඇරඹූ බව ප්‍රකටය. ලංකාව ආර්ය ජනාවාසයක් බවට පත් කිරීමෙහි පුරෝගාමියා වූයේ ශාක්‍ය වංශික විජය කුමාරයායි. ඔහු සමග පැමිණි පිරිස ලංකාවේ ජලාශ ආශ්‍රිතව ජනාවාස පිහිටුවා ගත් බව මහාවංශය මෙසේ අවධාරණය කරයි.

"ඔහුගේ ඇමතියෝ ඒ ඒ තැන ගම් පිහිට වූහ. අනුරාධ නම් ඇමතිතෙමේ කොලොම් හෝ ඉවුරෙහි අනුරාධ නම් ගම පිහිටවීය. පෙරෙවි උපතිස්ස තෙමේ අනුරාධපුරයෙහි උතුරු දිග ගම්භීර නදී තීරයෙහි, උපතිස්ස ග්‍රාමය ඉදි කළේය. අනික් ඒ ඇමතියෝ තුන් දෙනෙක් උදේනිය, උරුවේලාය, විජිත නගරයය වෙන වෙනම ඉදි කළෝය."[1]

ජනතාව ක්‍රමයෙන් වැඩි වෙත්ම රට අභ්‍යන්තරයේ ජලාශ්‍රිත ප්‍රදේශ තෝරාගෙන ජනාවාස ආරම්භ කොට ඇත. කෘෂි කාර්මික ජීවිතයේ ප්‍රධාන ආධාරකය ජලය නිසා ජලය ලබා ගැනීමට හැකි ප්‍රදේශ ලංකාවේ මුල් වාස භූමි විය. ගංගා ජලය ලබා ගත නොහැකි ප්‍රදේශවල වැසි ජලය රඳවා ගැනීමට වැව් තැනීමද

ප්‍රාග් අනුරාධපුර පාලන සමයේදීම සිදු විය. ලංකාවේ තත් මුල් ජනාවාස කවර ප්‍රදේශයන්හි වූයේ ද යන්න වල්පොල රාහුල හිමියෝ සිය "ලක්දිව බුදු සමයේ ඉතිහාසය" කෘතියේ දී මෙසේ පැහැදිලි කරති.

"මේ රටට පැමිණි ආදිම ආර්යයන් ජල පහසුව ඇති පෙදෙස් වල අලුතෙන් ජනපද පිහිට වූ බව මහාවංශ ටීකාවෙන් කියවේ." "තස්මිං තස්මිං සම්පන්නල සලිලාසයෙ භූමිප්පදෙසෙ ගාමෙ නිවේසයූං" මේ ජනපද වූයේ වැඩියෙන්ම ගංගා අසබඩයග අනුරාධ ග්‍රාමය, උපතිස්ස, උජ්ජේනි, උරුවේල හා විජිත වැනි අනිකුත් ජනපද ද පිහිටියේ කදම්බ නදී (මල්වතු ඔය) ගම්භීර නදී, කලා ඔය යන ගංගා අසබඩයි. මහවැලි ගඟ හා අඹන් ගඟ ඔස්සේ ද විශේෂයෙන්ම කච්ඡකතිත්ථ අවට තවත් ජනපද විය. දකුණෙහි ජනපද කුඹුක්කන් ඔය, මැණික් ගඟ, කිරිඳි ඔය, වලවේ ගඟ යන මේ ගංගා අතර බෙදී ගියේය. කැලණි ගඟබඩ තවත් ජනපදයක් විය. පහසුවෙන් ගංගා ජලය ලබාගත හැකි නුවූ තැන ජනාවාසයට යෝග්‍ය වන ලෙස වැව් බඳින ලදි.[2]

ජලාශ්‍රිතව ජනාවාස පිහිටු වීමේදී ප්‍රාග් අනුරාධපුර පාලන සමයේදීම ලංකාව ප්‍රධාන කොටස් දෙකක් වශයෙන් බෙදී ගිය අයුරු ඉහත ප්‍රකාශයෙන් පෙනේ. ඒ උත්තර දේශය හා රෝහණ දේශය වශයෙනි. ආර්යයන් ලංකාවට ගොඩබටුයේ උතුරු ප්‍රදේශයෙන් බව පිළිගත් ප්‍රබල මතය වන අතර දකුණේ කිරින්දට යැයි තවත් මතයක් ද වේ. හෙන්රිපාකර් මහතා සඳහන් කරන්නේ මහාගාම (දකුණේ) හා ඒ අවට ගම් ආර්යයන්ගේ මුල් ජනාවාස බවයි. වලවේ ගඟ, කිරිඳි ඔය, මැණික් ගඟ, කුඹුක්කන් ඔය ආශ්‍රිතව තත් ජනපද පිහිට වූ බව ඔහුගේ අදහසයි. ලංකාවට ආර්යයන් කුමන ප්‍රදේශයකින් ගොඩබටුයේ නමුත් ලංකාවේ මුල් ජනාවාස සියල්ලම ජලාශ්‍රිත ප්‍රදේශයන්හි වූ බවට නම් කිසිදු සැකයක් නැත.

ගංගා ජලය ලබා ගත නොහැකි ජනපදවල තම ජනාවාසයට සුදුසු පරිදි වැව් හෝ දිය අමුණු සකසා ගැනීමට ප්‍රාක්තන



අනුරපුර යුගයේ ජනතාව පෙළඹී ඇත. මහාවංශයේ පණ්ඩුකාභය කුමරුගේ චරිත විස්තරයේ ඔහු කළ වැවක් ගැන සඳහන්ය. ඒ අභය වැවයි. පණ්ඩුකාභය කුමරුගේ මාමා කෙනෙක් වූ ගිරිකණ්ඩශිව කරීය සියයක් හෙවත් අක්කර අටසියයක් වගා කළ බව ද මහාවංශයේ සඳහන්ය. (10 පරිච්ඡේදය) එසේම තමන් විසින් කරන ලද විලක ජලයෙන් පණ්ඩුකාභය කුමරු අභිෂේක ලත් බවද කියවේ.

"මයිලන්ගේ සේසත් ගෙන්වා මෙහි සයජාතවිල්හි ශෝධවා සේසත් නඟා ඒ විල දියෙන්ම ඒ පණ්ඩුකාභය කුමරු තමන් අභිෂේක කරවීය"[3]

ශ්‍රී ලංකාව ජනාවාස වීමේ දී ප්‍රධාන වශයෙන් ජලාශ්‍රිත ප්‍රදේශ මුලදී තෝරාගෙන ඇති බව වංශ කථා සාහිත්‍යයෙන් පෙනේ. ජනතාවගේ සීග්‍ර ව්‍යාප්තිය නිසා ගංගාශ්‍රිත ප්‍රදේශ ප්‍රමාණවත් නොවන බැවින් වියලි ප්‍රදේශ වලද ජනාවාස ආරම්භ කොට තම දෛනික අවශ්‍යතා වලට ජලය ලබා ගැනීමට හැකිවන අයුරෙන් වැව් හෝ අමුණු තනා ගත්තේය. රජරට ප්‍රදේශය "වැව් බැඳි රාජ්‍යය" වශයෙන් අදටද භාවිත කරන්නේ එබැවිනි. රාජ්‍ය පාලකයාගේ විශේෂ අවධානය යොමු වූයේ ද කෘෂි කර්මාන්තයට නිසා බැවින් විශාල වැව් තැනීමට විශේෂයෙන්ම රජුගේ මැදිහත් වීම සිදුවිය. සහලින් රට ස්වයංපෝෂිත කිරීමෙහිලා රාජුගේ මැදිහත් වීම විශාල වැව් වලින් අදටද සාක්ෂි සපයයි. ප්‍රධාන ජීවනෝපාය මාර්ගය වූ කෘෂි කර්මාන්තයට රජුගේ පටන් සාමාන්‍ය මහජනයා පවා මූලිකත්වය දුන් බව පැහැදිලි ය.

ගොවිතැන ප්‍රධාන වශයෙන් කොටස් දෙකකි. එනම් මඩ ගොවිතැන හා ගොඩ ගොවිතැන වශයෙනි. ගොඩ ගොවිතැන හේන් ගොවිතැන වශයෙන් ද හැඳින්වේ. මෙහි දී අපගේ උත්සාහය වන්නේ වී ගොවිතැන හෙවත් මඩ ගොවිතැන පිළිබඳ වතාවත් වල දක්නට ලැබෙන සංකල්පයන්හි බෞද්ධාගමික ලක්ෂණ පිළිබඳව විමසා බැලීමයි. ලෝකයේ වෙනත් රටවල

ගැමි ජනතාව මෙන්ම ලාංකීය ගොවි ජනතාව ප්‍රාක්තන යුගයේ පටන්ම කෘෂි ජීවිතයේ අනුගමනය කළ පිළිවෙත් රාශියක් දැක ගැනීමට පුලුවන.

වී ගොවිතැනේ භූමිය සකස් කිරීමේ පටන් මුල් අස්වැන්න අනුභව කෙරෙන තෙක් ක්‍රියා පද්ධතිය තුළ අනුගමනය කෙරෙන වතාවත් රාශියකි. ඒ සියලු වතාවත් වලට මූලිකත්වය ලබා දෙමින් ගොවිතැන ආරම්භ කරන ගොවියන් එමගින් අපේක්ෂා කරන්නේ තම අස්වැන්න වැඩි දියුණු කර ගැනීමත් විවිධ උවදුරු වලින් තම කෘෂි භෝග ආරක්ෂාකර ගැනීමත්ය. ඖෂධ භාවිතය, යාන්ත්‍රික ක්‍රම භාවිතය මෙන්ම අභිචාර විධි භාවිතය තුළින් තම කෘෂි භෝග ආරක්ෂා කර ගැනීමට උත්සාහ දරන ගොවියන් සාම්ප්‍රදායික අභිචාර පද්ධතියට මුල් ක්‍රියාවලියේ දීම පෙළඹෙන බව පෙනේ.

වී ගොවිතැනේ දී මෙවැනි අභිචාර විධි පවත්වන අවස්ථා තුනක් ප්‍රධාන වශයෙන් හඳුනාගත හැකිය. එනම් වී වැපිරීමට සැකසෙන භූමිය හෙවත් කුඹුරෙහි ආවතේව, අස්වැන්න නෙලා ගන්නා කමතෙහි වතාවත් මෙන්ම, අස්වැන්න තැන්පත් කෙරෙන වී බිස්සෙහි වතාවත්, වශයෙනි. මේ සියලු අවස්ථාවන් වල සාම්ප්‍රදායිකව රැකගෙන ආ අභිචාර රාශියක් දැනුදු පැරණි ගම්වල සිදුකෙරෙන බව දැක ගැනීමට පුලුවන. සමහර විටෙක විද්‍යාත්මක ක්‍රම කෘෂි කර්මාන්තයේදී යොදා ගැණුනත් සාම්ප්‍රදායිකව අභිචාර පද්ධතියක්, විද්‍යාත්මක ඥානයත් භාවිත කෙරෙන බව නූතන කෘෂි කර්මාන්තයෙන් දැක ගැනීමට පුළුවන.

කෘෂි කර්මාන්තයේදී අනුගමනය කරනු ලබන මේ අභිචාර පද්ධතිය "කෙම් ක්‍රමය" යනුවෙන් හැඳින් වේ. "ක්ෂේම" යන සංස්කෘත පදයෙන් තත්භව වූ "කෙම්" යන්නෙහි අදහස ආරක්ෂාව යන්නයි. තම කෘෂි භෝගවලට වැලදෙන රෝග මෙන්ම කෘමීන්ගෙන් වන්නා වූ උවදුරු නැතිකර ගැනීමට සිදු කරන්නා වූ ආගමික වතාවත් "කෙම් ක්‍රමය" යනුවෙන් හැඳින්වේ.



කෘමීන්ගෙන් පමණක් නොව වෙනත් සතා සිව්පාවන්ගෙන් ද කෘෂි භෝගය ආරක්ෂා කර ගැනීමට එමගින් අපේක්ෂිතය. ඒ බව පැරණි සිංහල සම්භාව්‍ය ගද්‍ය ග්‍රන්ථයන්ගෙන් ද පැහැදිලිය. සද්ධර්මරත්නාවලි කතුවරයා දේවදත්ත වස්තුවේදී කෙම් ක්‍රමය ගැන මෙසේ කියයි. "ගොයම් රෝගයට කෙම් කළ යුතුයි".[4] පූජාවලී කතුවරයාද "නොයෙක් රෝගයනට කෙම්පාන් කම්නේ නැතිව කළ මැනව"[5] යනුවෙන් මේ අභිචාර පද්ධතිය පිළිබඳ සිහිපත් කරයි. ගොවියාට කෘෂි කර්මාන්තය තම ජීවනෝපාය මාර්ගය වූවා සේම පුරාතන යුගයේ කෘෂි කර්මාන්තයේ ආරක්ෂාව වූයේ ද මේ අභිචාර හර පද්ධතියයි. ගොවියා විවිධ අවස්ථාවල සිදු කරනු ලබන මේ ආවතේව පද්ධතිය අභිචාර හර පද්ධතියක් ලෙසින් සලකනු ලබන්නේ ඒ හා බැඳි දේව විශ්වාස හා ආගම් භක්තිය පදනම් කරගෙනය. එසේම මේ ක්‍රියාදාමයන්ගේ රහස්‍යභාවය ආරක්ෂා කර ගැනීමට ද ගොවියෝ උත්සුක වූහ. කෙම් ක්‍රමය විටෙක සමූහයක් එකතු වී කරන අතර විටෙක එක් තැනැත්තෙක් වෙනත් කෙනෙකුගේ කටහඬ පවා මුසු නොවන ලෙස සිදු කරන අවස්ථා ද ඇත. හුදකලාව කරනු ලබන කෙම් ක්‍රම බහුලව දක්නට ලැබේ.

කුඹුරට දිය සපයන අමුණ සකසා ගැනීමේ පටන්ම ගොවියන් සිදුකරන ආවතේව රාශියකි. ශුභ දින ශුභ නැකතකින් මංගල දියවර ලබාගන්නා ගොවියා එහි දී අමුණ ලඟ මල් පැළ ඉදි කොට තෙරුවන් වන්දනා කොට දෙවියන්ට පිංදීම සිදු කරනු ලබයි. භූමියට අධිගෘහිත දෙවියන් වන්දනා කොට දේව කන්නලව් කිරීම ද එහි දී සිදු කෙරේ. කුඹුරු යායක් අස්වද්දනු ලබන්නේ ද ශුභ මොහොතක සියලු ගොවියන් එම කුඹුරු යායට එකතු වී තෙරුවන් වන්දනා කොට පිං දීමෙන් අනතුරුවය. මල් පැල සිටුවා භූමියට (ඒ ඒ පළාතට) අධිගෘහිත දෙවියන් වන්දනා කොට දෙවියන් සතුටුකොට වැඩ අරඹන ගැමි ගොවියෝ කන්නයක මංගල කෘෂි ක්‍රියාවලිය උත්සවශ්‍රීයෙන් ආරම්භ කරති. පළමු ක්‍රියාවලියේ සිට වී බිස්සට යන තෙක් ක්‍රියාදාමය තුළ සාමූහික කයිය, අත්තම, ප්‍රධාන තැනක් ගත්තද ඒ ඒ ගොවියාට

සිය පරම්පරාවෙන් උරුම වූ හෝ වෙනත් හිතවතෙකුගෙන් අසා දැනගත් කෙම් ක්‍රමය වනාහි පෞද්ගලික ක්‍රියාවක්ම වෙයි. කෙම් ක්‍රමයක් සිදුකරන ගොවියා පළමුවෙන්ම නා පිරිසිදු වීමද, පිලි ආහාර වලින් වැලකී සිටීමද සිදු කරනු ලබයි. හිරු උදාවීමට මත්තෙන් සිදු කරනු ලබන ආවතේවවලදී පෙරදින හවස් භාගයේ සිටම ඒ සඳහා කැපවී සිටීමට ගොවියා වග බලා ගනී. දේව විශ්වාසය හා ආගම් භක්තිය පෙරදැරිව කරනු ලබන එම ආවතේවවලදී කිල්ලට හසු නොවීමට ගොවියෝ නිතරම වගබලා ගනිති. විවිධ අවස්ථාවන්වල සිදු කරනු ලබන එවැනි අභිචාර විධි අතර දක්නට ලැබෙන බෞද්ධාගමික සංකල්ප කෙරෙහි මීලඟට අප අවධානය යොමු වේ.

තෙරුවන් හා දේව වන්දනාවෙන් ආරම්භ කරන කුඹුරු යායක මූලික හර ක්‍රියා පද්ධතියෙන් පසුව ඒ ඒ ගොවියා තම තමනට අයත් කුඹුරු වපසරිය සාමුහිකව හෝ හුදකලාව බීජ සිටුවීමට සුදුසු පරිදි සකසා ගනියි. "සාමුහික කයිය" "අත්තම" මෙහිදී ද කැපී පෙනෙන ශ්‍රම විභජනයකි. පැළ සිටුවීමට කුඹුර සකසා ගන්නා අතරතුර එක් ලියදි කොණක බීජ පැලකර ගනියි. "පැල තවාන" යනුවෙන් හඳුන්වන එම වැපිරීම අභිචාර විදීන්ගෙන් යුක්තව සිදු කරන බව අදට ද දැක ගැනීමට පුළුවන. එහිදී තවානට සකසාගත් ලියදි කොටසට බීජ වපුරන තැනැත්තා පෙර දින සිට පිලි ආහාරයෙන් වැලකී සිට තෙරුවන් ගුණ සිහිපත් කරමින් කිසිවෙකුගේ හඬට මුසු නොවී දිසාසු දස භාගේසු[6] යනුවෙන් සඳහන් දස දිසා සූත්‍රය මතුරමින් මෙන් සජ්ඣායනය කරයි. එසේම රතන සූත්‍රයේ සඳහන්

වනප්පප ගුම්බේ යථා ඵුස්සිතග්ගෙ -
ගිම්හාන මාසේ පඨමස්මිං ගිම්හෙ
තථූපමං ධම්මවරං අදෙසයි -
නිබ්බාණ ගාමිං පරමං හිතාය
ඉදම්පි බුද්ධෙ රතනං පණීතං -
එතෙන සච්චේන සුවත්ථි හෝතු[7]



ගාථාව 108 ක් බීජවලට (වී වලට) මතුරා වැපිරීම ද සිදු කරනු ලබයි. ගොවියා මෙයින් අපේක්ෂා කරන්නේ වැපිරූ තත් බීජ සරුවට වැඩීමත් කෘමි ආදීන්ගෙන් වන්නා වූ උවදුර නැතිකර ගැනීමත් ය. තම කුඹුරු වපසරියට අඩු නොවන පරිදි පැළ හටගැනීමත්, හටගත්තා වූ පැළවලට දිලීර ආදී බෝවන රෝග න වැලදීමත් තත් අභිචාර හර පද්ධතියෙන් අපේක්ෂා කෙරේ. සත්‍යක්‍රියා බලයක ස්වරූපයෙන් මෙම අභිචාර ක්‍රමයන් භාවිත කරනු අද ද සාම්ප්‍රදායික ගමක දක්නට පුළුවන.

ගොයම් සිටුවීමට කුඹුර ලියදි සකසා ගත් පසු බීජ තවානෙන් පැළ ගලවා ගොවි ගෙවිලියන් ඒ ඒ ලියදිවල එම පැල සිටුවයි. "නෙළුම" යන පදයෙන් එම අවස්ථාව හඳුන්වයි. කාංසිය හා ඇගපත රුදාව මග හරවා ගැනීමට මෙහි දී තත් ගොවි ගෙවිලියෝ ජනකවි ගායනා කරති. දහම් ගැට ප්‍රහේලිකා, විනෝද ප්‍රකාශන මෙන්ම ආශිර්වාදාත්මක ප්‍රකාශන ද එම නෙළුම් කවිවලින් ප්‍රකාශිතය. ගොයම් පැල සිටුවීමෙන් පසු වැඩීගෙන එන ගොයම ආරක්ෂා කර ගැනීමට විවිධ පිරිත් සූත්‍ර ගාථා පාඨ උපයෝගී කර ගනිමින් පවත්වනු ලබන අභිචාර විධි රාශියක් දැක ගැනීමට පුළුවන. විවිධ වර්ගයේ කෘමීන් ගොයමට හානි කරන අවස්ථාවලදී අවිහිංසාවාදී බෞද්ධ ගොවියා ඔවුන් පලවා හැරීමට විවිධ කෙම් උපයෝගී කර ගත්තේය. වර්ධනය වන ගොයමට හානි කරන කෘමීන් අතර මීයා ගොයම් මැස්සා හා ගොයම් පනුවා ප්‍රධාන තැනක් ගනී. එසේම මාංශ භක්ෂණය උදෙසා පැමිණෙන ඌරන්ගෙන් ද හිවලුන්ගෙන් ද ගොයම් වගාවට හානි පැමිණෙයි. එවැනි අවස්ථාවල ගොවියා දහම් පද උපයෝගී කරගනිමින් සිදු කරන කෙම් ක්‍රම රාශියකි. විශේෂයෙන්ම මෙහි දී රතන සූත්‍රය, කරණීය සූත්‍රය, රන්දෙනේ ගාථා, ඇණවුම් පිරිත, ධජග්ග සූත්‍රය, ජලනන්දන සූත්‍රය, රත්නමාලා බන්ධන ගාථා ආදිය යොදා ගනියි. තෙරුවන් ගුණ සහිත මන්ත්‍ර භාවිත කරන අවස්ථා ද කෙම් ක්‍රමයන්හි දී දැක ගැනීමට පුලුවන.

කෘමීන්ගෙන් ගොයම ආරක්ෂා කර ගැනීමේ දී පහත සඳහන් ගාථා පාඨ යොදා ගැනේ.

සබ්බ පාපස්ස අකරණං - කුසලස්ස උපසම්පදා
සචිත්ත පරියෝදපනං - ඒතං බුද්ධාන ශාසනං[8]

ගාථාව 108 වතාවක් වැලිවලට මතුරා හිරු නැගීමට මත්තෙන් කුඹුරට ඉසීමෙන් කෘමීන්ගෙන් ගොයම ආරක්ෂා කර ගනී. ගොයම් මැස්සන් එළවීමට ඉහත සඳහන් ගාථාවම සජ්ඣායනය කරමින් තඹ තැටියකට නාද කරමින් කුඹුර වටේ යා යුතුය. මල් පැල සිටුවා තෙරුවන් වන්දනා කිරීමෙන් පසු කුඹුරෙහි තුන් තැනක සිට තඹ තැටියට තුන් වතාවක් ගැසීමෙන් ගොයම් මැස්සන් එම කුඹුර අත්හැර යන බව ගොවියෝ ප්‍රායෝගික ක්‍රියාකාරකමින් අවබෝධ කරගෙන සිටියහ. එසේම ගොයම් මැස්සන් එලවීමට සිව්රු රෙදි වලින් සකසා ගන්නා පහන්තිර කුඹුරෙහි දැල්වීමද සිදු කරයි. මී තෙලින් පොගවා කුඹුරේ තැන් තැන්වල දැල්වෙන එම පහනෙහි පහන් තිර තුනක් බැගින් යොදා ගනියි. ඒ ත්‍රිවිධ රත්නයේ ගුණ සිහිපත් කිරීමට ය. තිර හතරක් යොදා ගන්නා ගොවියෝ ද වෙති. සතර වරම් දෙවිවරු සිහිකර ගැනීම එමගින් අපේක්ෂිතය. මැස්සන් එළවීමට පහත සඳහන් බුදුගුණ, දම් ගුණ, සහිත මන්ත්‍රය ද භාවිත කරගනී.

"ඕං නමෝ තෝ උපන්නේ විශාලා මහනුවරයි. මම උපන්නේ සුවාසු දහසක් ධර්මස්ඛන්ධයේ ය. තාගේ මව් නැත. පියා නැත. බුදුන් අණින් සීමා පන්නා යව් යව් සිද්ධි සිද්ධි ඒස්වාහඃ"[9]

මෙම මන්ත්‍රය 108 වතාවක් වැලි වලට මතුරා කුඹුරට ඉසීමෙන් ගොයමට විනා කරන විවිධ වර්ගයේ කෘමීන් ගොයමෙන් ඉවත්ව යන බව ගොවියෝ විශ්වාස කරති. සී සෑමේ දී සජ්ඣායනය කරනු ලබන රතන සූත්‍රයේ සඳහන් මේ ගාථාවද කෘමීන්ගෙන් ගොයම රැකගැනීමට යොදා ගනියි.

"කිඤ්චාපි සො කම්මං කරොති පාපකං
කායෙන වාචා උදචෙත සාවා"[10]



කරණීය සූත්‍රයේ සඳහන්

"දිට්ඨිංච අනුපගම්ම සීලවා
දස්සනේන සම්පන්නෝ
කාමේසු විනෙය්‍ය ගෙදං
නාහිජාතු ගබ්භ සෙය්‍යං පුනරේතීති"[11]

ගාථාව 108 ක් වැලිවලට සජ්ඣායනය කිරීම ද

ධජග්ග සූත්‍රයේ සඳහන්

තං කිස්සහේතු තථාගතො භික්ඛවෙ අරහං සම්මා සම්බුද්ධො වීතරාගො, වීත දොසො, වීත මොහො අභිරු අච්ජම්භි අනුත්‍රාසි අපලායීති .......... අනුස්සරෙථ සම්බුද්ධං භයං තුම්හාක නොසියා. නොචේ බුද්ධං සරෙය්‍යාථ ලොකෙ ජෙට්ඨං නරා සභං .........[12]

පාඨය තල්පත් වල ලියා කුඹුරේ තැන තැන එල්ලීමෙන් ද

රතන සූත්‍රයේ සඳහන්

වනප්පගුම්බේ යථා ඵුස්සි තග්ගෙ
ගිමහාන මාසෙ පඨමස්මිං ගිම්හෙ ..........[13]

වරො වරඤ්ඤෙූ වරදො වරාහරෝ
අනුත්තරෝ ධම්ම වරං අදෙසයිං ......[14]

වැපිරීමේදී මෙන්ම පැළ ආරක්ෂා කර ගැනීමේ දී භාවිත කර ගනී. ජලයට 108 ක් මේ ගාථා දෙකින් එකක් (මතුරා) සජ්ඣායනය කොට එම ජලය ගොයමට ඉසීමෙන් ද ජලනන්දන පිරිත ජලයට 108 වතාවක් සජ්ඣායනය කොට එම ජලය ගොයමට ඉසීමෙන් ද රත්නමාලා බන්ධන ගාථා එනම්,

සංසාර සාරොස විනීතණිසං
සංනීත සාතං සුවිසාර ධීසං[15]

ගාථාත්‍රය 108 ජලයට සජ්ඣායනය කොට ගොයමට ඉසීමෙන් ද ගොයම නොයෙක් දිලීර රෝගයන්ගෙන් හා කෘමීන්ගෙන්

ආරක්ෂා කර ගැනීමට ගොවියෝ උත්සුක වූහ. අදටත් උත්සුක වෙති. දිලීර රෝගයන්ගෙන් මෙන්ම කෘමීන්ගෙන් ගොයම ආරක්ෂා කර ගන්නට කරන මේ සියලු අභිචාර විධීන් නියමිත ආවතේව සමුදායක් හා බද්ධව පවතී. නා පිරිසිදු වී පිලි ආහාරයෙන් වැලකී සිට තෙරුවන් වන්දනාකොට තත් ප්‍රදේශයන්හි අධිගෘහිත ඉෂ්ට දේවතාවන් සිහිපත්කොට කරනු ලබන මේ කෙම් ක්‍රමයන්හි අවිහිංසාවාදය පෙරදැරිව ඇති අස්වැන්නෙහි සශ්‍රීකත්වය ද එමගින් අපේක්ෂා කරන ගොවියෝ මේ අභිචාර හර පද්ධතිය කෙරෙහි දැඩි විශ්වාසයක් දක්වති.

අස්වැන්න නෙලා ගැනීමේ ක්‍රියාවලිය ආරම්භ කරන්නේ ද කුඹුරු යායේ ගොවියන් එකතු වී මල්පැළ සිටුවා තෙරුවන් වන්දනා කිරීමෙන් හා ඉෂ්ට දේවතා වන්දනයෙන් පසුවයි. සාමූහික ක්‍රියාවක් ලෙසින් එම ක්‍රියාව අගය කරන ගොවියෝ සියලුම දෙනා එම අභිචාර හර පද්ධතියට සහභාගී වෙති. වයෝවෘද්ධ ගොවි මහතුන් කීප දෙනෙකු පිරිත් සජ්ඣායනය කරනු අද ද ඇතැම් ගමක දක්නට ලැබෙයි. කපු මහතා හෝ එයටම පරම්පරාවෙන් උරුමකම් කියන ගොවි මහතෙකු දේවස්තෝත්‍ර ගායනා කරයි. අස්වැන්න වී බිස්සට ගන්නා තෙක් අතුරු ආන්තරා නොවේවා යන ප්‍රාර්ථනාව එම අභිචාර ක්‍රියාවෙන් අපේක්ෂිතය.

ගොයම් කරල පාගා වී බවට පත්කර ගන්නා කමතේ දී පිළිපදින ආවතේව රාශියක් දැක ගැනීමට පුළුවන. මී හරකුන්ගෙන්, මිනිසුන්ගෙන් හෝ නවීන යන්ත්‍රෝපකරණයන්ගෙන් වී මඩිනු ලබයි. අඩි 20 ක් 25 ක් පමණ විෂ්කම්භයෙන් යුත් ප්‍රදේශයක් තුළ පොළොව සැස සකස් කර ගන්නා කමතෙහි පළමුව "අලුහන් වැඩීම" සිදු කරයි. අලු වලින් යන්ත්‍රයක් ඇඳීම ඒ ඒ ප්‍රදේශ වල විවිධාකාරයෙන් සිදු කරයි. "ජලනන්දන යන්ත්‍රය" "සිරිපතුල" "වෘත්තයක්" "චතුරස්‍රයක්" ස්වස්තික ලකුණ ලෙසින් අඳින මෙම යන්ත්‍රයේ "නමෝ බුද්ධාය" "ස්වස්ති" "ඕං ශ්‍රී ං" ආදි වචන ලියනු ලබයි. ඇතැම් ප්‍රදේශවල අලු යන්ත්‍රයේ ඉර හඳ බෝලත්ත, කුල්ල,



හක්ගෙඩිය, පද්මය, ත්‍රිශූලය, ස්වස්තිකය, ආදී යන්ත්‍ර අඳිනු ලැබේ. දෙවිවරුන් නියෝජනයක් මෙමගින් සිදු කෙරෙන බව පැහැදිලිය.

අලු යන්ත්‍රයේ ඇතැම් ප්‍රදේශවල "අක්ෂර" සටහන් කරනු ලැබේ. මෙම අක්ෂර පිරිත් ගාථාවලින් ගත් ගුප්තාක්ෂර ලෙස සමහරු සලකති. "සබ්බ පාපස්ස අකරණං" ගාථාව හෝ එයින් ගත් සමහර අකුරු අලු යන්ත්‍රයේ සංකේතවත් කරයි. කමතේ දී සකස් කර ගන්නා අස්වැන්න ආරක්ෂා කර ගැනීමේ දී ගොවියෝ විශේෂයෙන් දෙවියන්ගේ පිහිට අපේක්ෂා කරති. බහිරවයාගෙන් තම ධාන්‍ය ආරක්ෂා කර ගැනීමට දෙවියන් කමතට ගෙන්වා ගැනීමේ අරමුණෙන් මෙම අභිචාර පවත්වති. ඒ ඒ පළාතට අධිගෘහිත දෙවියන්ට පිං දී ඒ ඒ දෙවියා වෙනුවෙන් වෙන් වූ පූජා කමතෙහි සතර කොණෙහි හෝ එක් කොණක තබා දේව පූජා කොට දෙවියන්ගේ ආරක්ෂාව බලාපොරොත්තු වන ගොවියෝ කමතේදී විශේෂයෙන් පිළිපදින ආවතේව හර පද්ධතියකට උරුමකම් කියති. කොල මැඩීම ආරම්භ කිරීමට මත්තෙන් අලු යන්ත්‍රය තුළට විවිධ භාණ්ඩ දැමීම සිදු කරයි. කොහොඹ ලැල්ලක්, හක්ගෙඩියක්, ගිරයක්, යකඩ ලැල්ලක්, උකුණු ගහ, ආදිය ඒ සඳහා යොදා ගනී. කොහොඹ ලැල්ලේ ඇණවුම් පිරිතෙහි සඳහන්

"සබ්බේතං අනුමෝදිත්වා
සමග්ගා සාසනෙ රතා
පමාද රහිතා හොන්තු
ආරක්ඛාසු විසෙසතො"[16]

ගාථාව රචනා කරමින් විවිධ සංකේත නිරූපණය කරයි. බහිරවයාගෙන් තම ධාන්‍ය ආරක්ෂා කර ගැනීමට මේ සියලු අභිචාර විධි පැවැත්වීමට ගොවියෝ පෙළඹ සිටිති.

කමතේ දී සකස් කර ගන්නා අස්වැන්න වී බිස්සෙහි තැම්පත් කරන්නේ ද ශුභ දිනක ශුභ නැකතකින් ය. තැම්පත් කළ එම අස්වැන්න ආරක්ෂාකර ගැනීමට යොදන කෙම් ක්‍රමයක් වශයෙන්

පිරිත් ගාථා ලියූ තල්පත් කොල බිස්සට දමයි. එම තල්පත්වල ලියන පිරිත් ගාථා කීපයක් ඇත. එනම් කරණීය සූත්‍රයේ ආරම්භක ගාථාවත්

"යස්සානු භාවතො යක්ඛා - නෙව දස්සෙන්ති භිංසනං
යම්හි චේවානුයුඤ්ජන්තො - රත්තින්දිව මතින්දිතො
සුඛං සුපති සුත්තොච - පාපං කිඤ්චින පස්සති
එවමාදි ගුණොපේතං - පරිත්තං තං භණාමහෙ"[17]

රන්දෙනේ ගාථාවල සඳහන් පහත ගාථාවත්

"උණ්හීස රුචිරොදාර - ලලාට තල සොභිතො
මුදු තුලානි භොදාත - උණ්ණමණ්ඩල මණ්ඩිතො
නමො රාජගුරු හුරු ගුරු බොධි මණ්ඩලේස්වා හඃ"[18]

පහත සඳහන් ගාථාවත්

"සබ්බ පාපස්ස අකරණං - කුසලස්ස උපසම්පදා

සචිත්ත පරියෝදපණං - ඒතං බුද්ධානු සාසනං"[19]

තල්පත්වල ලියා වී බිස්සට දැමීමෙන් කෘමීන්ගෙන් වන විනාශය වලක්වා ගනිති. තෙරුවන් ගුණ ලියූ තල්පත් ද ජල නන්දන යන්ත්‍රය ආදී තඹ පත් ද බිස්සට දැමීමත් මේ කෙම් ක්‍රම අතර දක්නට ලැබෙයි.

මුල් අස්වැන්න භුක්ති විඳීමේ කාර්යයේ ද බුද්ධ පූජාව පැවැත්වීමටත්, භික්ෂූන්ට දන් පූජා කිරීමටත්, දෙවියන්ට ආහාර පූජා කිරීමටත් ගොවියෝ අමතක නොකරති. කිරිභාර පූජාව අලුත් සහල් මංගල්‍යය යන නම්වලින් එම පූජාවන් පැවැත්වේ. මෙම ක්‍රියාව බොහෝ කොට සාමූහිකව කෙරෙන අතර සාමූහික ජන විඤ්ඤාණයට ගරු නොකරන ඇතැම් පිරිස් පෞද්ගලිකව මෙම පූජාවන් පවත්වති. කෘෂි ජීවිතයේ මුල් කටයුත්තේ පටන්ම තෙරුවන් හා දෙවියන් පිහිට යදින ගොවියෝ අස්වැන්න භුක්ති විඳීමේ දී එම අස්වැන්න රැක දුන් අයට කෘත ගුණ සැලකීමක් වශයෙන් ද මේ පූජාවන් පවත්වති.



කෘෂි කර්මාන්තයේ මුල් අවස්ථාවේ සිට අස්වනු භුක්ති විඳීමේ ක්‍රියාදාමය තෙක් සිදු කරනු ලබන කෙම් ක්‍රමයන්හි උපලක්ෂිත බෞද්ධ සංකල්ප ඉහත කරුණු වලින් පැහැදිලි වේ. විද්‍යාත්මක ඥානය පදනම් කරගත්ත ද සාම්ප්‍රදායික සිරිත් විරිත් වලින් ඉවත්වීමට අකමැති ගොවියෝ මේ අභිචාර හර පද්ධතිය ක්‍රියාවට නගති. අවිහිංසාවාදය, අන්‍යෝන්‍ය සම්බන්ධය. සමගිය, කරුණාව, දයාව, මෛත්‍රිය, ඉවසීම, කෘතගුණ සැලකීම, පරෝපකාරය, වැඩිහිටියන්ට පිදීම, මෙන්ම නිහතමානි බව මේ අභිචාර හර පද්ධතියන් සමඟ බැඳී පවතී. උතුම් පුරුෂාර්ථ සාධනය මෙන්ම ධාර්මික දිවිපැවැත්ම අපේක්ෂා කරන සිංහල බෞද්ධ ගැමි ගොවියෝ අදටත් මේ අභිචාර ක්‍රියාදාමයන් තම කෘෂි ජීවිතයේ දී උපයෝගි කරගනිමින් දැහැමිව ධනය උපයා ගනිති. අවිහිංසාවාදිව ධනය උපයා ගනිති. අවිහිංසාවාදිව ධනය ඉපැයීමෙහි ධාර්මික විනෝදාස්වාදය විඳිති.

## ආන්තික සටහන්

[1] මහාවංශය, (සිංහල පරිවර්තනය) ශ්‍රී සුමංගල හිමි, බටුවන්තුඩාවේ දේවරක්ෂිත, එස්.ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10, 1999. 40

[2] රාහුල හිමි වල්පොල , ලක්දිව බුදු සමයේ ඉතිහාසය, එස්.ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10, 1999. 24

[3] මහාවංශය, (සිංහල පරිවර්තනය) සංස්ඃ ශ්‍රී සුමංගල හිමි, බටුවන්තුඩාවේ දේවරක්ෂිත, එස්.ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10, 1999. 50

[4] සද්ධර්මරත්නාවලිය, ප්‍රාචීන භාෂෝපකාර සමාගම, එස්.ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10, 2000. 124

[5] පූජාවලිය, සංස්ඃ වේරගොඩ අමරමෝලි හිමි, එස්.ගොඩගේ සහ සහෝදරයෝ, මරදාන, 1999. 376

[6] පිරුවානා පොත, සම්පාදක ඃ බෝදාගම චන්දම හිමි, ශ්‍රී ලංකා ධර්මචක්‍ර ළමා පදනම, බණ්ඩාරගම, 1998. 129

[7] පිරුවාන පොත, සංස් ඃ අත්තුඩාවේ සිරි රාහුල හිමි, සමයවර්ධන පොත්හල, කොළඹ 10, 1994. 11

[8] ශ්‍රී ඤාණෝභාස තිස්ස හිමි මොරගොල්ලේ, බුද්ධකනිනායට්ඨ ධම්මපද විවරණය, සංස් ඃ ඇම්.ඩී.ගුණසේන සහ සමාගම, කොළඹ, 1962. 385

[9] පිරුවානා පොත සම්පාදක ඃ බෝදාගම චන්දිම හිමි, -එම- 333

[10] පිරුවානා පොත, සංස්ඃ අත්තුඩාවේ සිරි රාහුල හිමි, - එම- 285

[11] -එම- 286

[12] -එම- 288

[13] -එම- 285

[14] -එම- 285

[15] -එම- 281

[16] -එම- 252

[17] -එම- 302

[18] -එම- 265

[19] ශ්‍රී ඤාණෝභාස තිස්ස හිමි, මොරගොල්ලේ, බුද්ධකනිනායට්ඨ ධම්මපද විවරණය, සංස් ඃඇම්.ඩී.ගුණසේන සහ සමාගම, කොළඹ, 1962. 385